ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය
இலங்கை கணினி அவசர தயார்நிலை அணி
Sri Lanka Computer Emergency Readiness Team

SRI LANKA CERT|CC

කාමර අංක. 4-112, බී.එම්.අයි.සී.එච්, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.
அறை இல. 4-112, பி.எம்.ஐ.ஸி.எச், பௌத்தாலோக மாவத்தை, கொழும்பு 07.
Room No. 4-112, BMICH, Bauddhaloka Mawatha, Colombo 07.

**01.01.2026**

## Press Release

**ගත වූ වසරේදී ශ්‍රී ලංකා CERT ආයතනයට සයිබර් ආරක්ෂාව පිළිබඳ පැමිණිලි 12650 ක්. මාර්ගගත හිරිහැර හා වංචාවල වැඩිවීමක් පිළිබඳව අනතුරු ඇඟවීමක්.**

අන්තර්ජාලය හරහා සහ සමාජ මාධ්‍ය අනිසි භාවිතය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පරිගණක හදිසි සූදානම් සංසදයට (ශ්‍රී ලංකා CERT) 2025 දී පැමිණිලි 12650 කට වඩා ලැබී තිබේ. මෙය පෙර වසර හා සසඳන විට මාර්ගගත වංචා, ඩිජිටල් වංචා සහ සයිබර් හිරිහැරවල සැලකිය යුතු වැඩිවීමක් පෙන්නුම් කරන බව එම ආයතනය සඳහන් කර සිටී.

ශ්‍රී ලංකා CERT හි ප්‍රධාන තොරතුරු ආරක්ෂක ඉංජිනේරු චාරුක දමුණුපොල මහතාට අනුව, පැමිණිලිවලින් සැලකිය යුතු ප්‍රතිශතයක් ව්‍යාජ ගිණුම්, හැක් කරන ලද ගිණුම් සහ සමාජ මාධ්‍ය වේදිකා හරහා සිදු කරන ලද මූල්‍ය වංචා සම්බන්ධයෙන් වේ.

වෛරී හෝ අපයෝජන අන්තර්ගතයන් සහ වැඩිහිටියන්ගේ ලිංගික හිරිහැර පිළිබඳ අන්තර්ගතයන් ද පැමිණිලි අතර ඉහළ මට්ටමක පවතී. තවද, පුද්ගලයන්ට සහ සාමාන්‍ය ජනතාවට බලපාන සාමාන්‍ය වංචා සහ අසත්‍ය තොරතුරු බෙදා හැරීමේ කැපී පෙනෙන වැඩිවීමක් ද මෙහි දක්නට ලැබෙන බව ඔහු පැවසීය. පුද්ගලයන් රවටා ඔවුන්ගේ බැංකු ගිණුම් අංක, OTP හා මුරපද සහ QR කේත ආදී පුද්ගලික තොරතුරු ලබාගනිමින් සයිබර් අපරාධකරුවන් මෙලෙස කටයුතු කරන බවද නිරීක්ෂණය වී ඇත.

සන්නිවේදනය, වෙළඳාම සහ මූල්‍ය කටයුතු සඳහා ඩිජිටල් වේදිකා ඔස්සේ කටයුතු කිරීම සඳහා වැඩිවන විශ්වාසයේ වාසිය ලබා ගැනීම සඳහා සයිබර් අපරාධකරුවන් වඩ වඩාත් නවීන හා වංචනික ක්‍රම භාවිතා කරමින් සිටී. විශේෂයෙන් අවධානමට ලක්විය හැකි කණ්ඩායම්, එනම් අන්තර්ජාල ආරක්ෂණ ක්‍රියා පටිපාටි පිළිබඳව ප්‍රමාණවත් දැනුමක් නොමැති තරුණ තරුණියන්, වැඩිහිටි පරිශීලකයින් සහ පළමු වරට අන්තර්ජාල භාවිතා කරන්නන් මෙවැනි වංචාවන්ට ගොදුරු වන පුද්ගලයන් අතර නිතර දක්නට ලැබේ.

අන්තර්ජාලය තුල සුපරීක්ෂාකාරීව සිටින ලෙසත්, පුද්ගලික හෝ මූල්‍ය තොරතුරු අන්තර්ජාලය ඔස්සේ බෙදා ගැනීමෙන් වළකින ලෙසත්, සැක සහිත පණිවිඩ සහ සබැඳි සත්‍යාපනය (verify) කරන ලෙසත්, ද්වි-සාධක සත්‍යාපනය (Two factor authentication) සහ ආරක්ෂිත මුරපද වැනි ශක්තිමත් ආරක්ෂක පියවරයන් සක්‍රීය කරන ලෙසත් චාරුක දමුණුපොල මහතා මහජනතාවගෙන් ඉල්ලා සිටී. මෙවැනි සිදුවීම් සම්බන්ධයෙන් කඩිනම් ප්‍රතිචාර දැක්වීම සහ අවම කිරීම පහසු කිරීම සඳහා, සයිබර් සිදුවීම් පිළිබඳව වහාම ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (CERT) වෙත වාර්තා කරන ලෙස මහජනතාවගෙන් ද ඉල්ලා සිටී.

රට පුරා සයිබර් ප්‍රහාරයන්ට මුහුණ දීමේ හැකියාව, මහජන දැනුවත්භාවය සහ ඩිජිටල් ආරක්ෂාව වැඩි දියුණු කිරීම සඳහා, සයිබර් ආරක්ෂණ සිදුවීම් ප්‍රතිචාර සඳහා ජාතික අධිකාරිය වන ශ්‍රී ලංකා CERT, පොලිසිය, නීතිය ක්‍රියාත්මක කරන සංවිධාන, සේවා සපයන්නන් සහ වෙනත් අය සමඟ සමීපව සහයෝගයෙන් කටයුතු කරන බව දමුණුපොල මහතා පැවසීය.

සහාය සඳහා හෝ සයිබර් සිදුවීමක් වාර්තා කිරීමට, මහජනතාවට 101 ක්ෂණික දුරකථන අංකය ඔස්සේ ශ්‍රී ලංකා CERT ආයතනය ඇමතීමට හෝ report@cert.gov.lk විද්‍යුත් තැපැල හරහා එවිය හැක.

---

වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර චාරුක දමුණුපොළ මහතා 0741441907 අමතන්න.

දුරකථන / தொலைபேசி / Telephone: 11-269 1692, 101 (Hot Line)
ෆැක්ස් / தொலைநகல் / Fax: 11-269 1064
ඊ-තැපැල / மின்னஞ்சல் / E-mail: info@cert.gov.lk
වෙබ් / இணையதளம் / Web: www.cert.gov.lk
https://lk.linkedin.com/company/sri-lanka-cert-cc
https://www.facebook.com/CERT.lk/

No.0064